www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ඇමරිකානු ජනාධිපතිවරනය:

# බුෂ්-කෙරී විවාදය: අපේක්ෂකයන් දෙදෙනාම යුද්ධයට කැපවෙයි

**Bush-Kerry debate: two candidates committed to war**

**සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂක බිල් වැන් ඕකන් විසිනි**
**2004 ඔක්තෝබර් 01**

ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් සහ සෙනෙට් සභික ජෝන් කෙරී අතර පැවැත්වෙන ජනාධිපතිත්ව විවාද මාලාවේ පලමුවැන්න මගින් ඇමරිකානු මහජනතාවට ඉදිරිපත් කෙරුනේ දෙදෙනාගෙන් කවරෙකු හෝ තෝරා ගත නො හැකි ශූන්‍ය වරනයකි. අපේක්ෂකයන් දෙදෙනාම ඉරාකය තුල යුද්ධය ඉදිරියට ගෙන යාමටත්, ලොව පුරා එක්සත් ජනපද මිලිටරිවාදය ඉහල නැංවීමටත් එක සේ කැප වූහ.

ඉරාකීය මහජනතාවට එරෙහි සාපරාධී යුද්ධයේ අවසානයක් අපේක්ෂා කරන මිලියන සංඛ්‍යාත ඇමරිකානුවන්ගේ බලගතු හැඟීම්වලට විවාදය තුලින් ප්‍රකාශනයක් අත් නො වී ය. මෑත මාස කීපය තුල ඉරාකයට අති බිහිසුනු ම වූ දිනයන්ගෙන් එකක පැවැත්වුනු මෙම විවාදයේ දී, අපේක්ෂකයින් දෙදෙනාගෙන් කවරෙකු විසින් හෝ එක්සත් ජනපද ආක්‍රමනය හේතුවෙන් දුක් විඳින ඉරාක මහ ජනතාව සම්බන්ධව හා එහි සිදු කෙරෙන මිනිස් සංහාරය සම්බන්ධව කවර හෝ ඍජු සඳහනක් නො කෙරින.

මියාමි සරසවියේ පැවැත් වූ විවාදයෙන් ජයග්‍රහනය කලේ කවුරුන් ද යන්න විශාරදයන් විසින් තීන්දු කරද්දී සංගත මාධ්‍යයන් තුල දේශපාලන විශ්ලේෂන ලෙසින් ඉදිරිපත් කෙරෙන ඈ අතරින් බොහොමයක් ම අපේක්ෂකයින් දෙදෙනාගේ මුහුනුවලින් පිලිබිඹු වූ හැඟීම්වලට සහ ඔවුන්ගේ "දේහ භාෂාවට" කේන්ද්‍රගත කෙරෙනු ඇත. මිනිත්තු 90ක් පුරා පැවැති මෙම මුන ගැටුමේ දී ඉන් වැඩි කාලයක් තුල පුලුටු කර ගත් මුහුනෙන් යුතුව නොසන්සුන්තාවෙන් පසු වූ බුෂ්ට, ඉරාකය තුල එක්සත් ජනපදස මැදිහත් වීමට පිටුබලය සැපයීමේ දී කෙරී වැනෙන සුලු වූයේ යැයි පහර දෙමින් සුපුරුදු වාග් මාලාව පුනරුච්චාරනය කිරීමට වැඩි යමක් කල නො හැකි විය. බුෂ් ඔහුගේ ආගමික ශ්‍රද්ධාව පෙන්වීමටත්, ක්‍රිස්තියානි දක්ෂිනාංශය තුල තම පදනමට ආයාචනය කිරීමටත්, තම අදහස් අතරට වරින් වර සුලබ ආගමික වැකි ඇතුලු කලේ ය.

කෙරීගේ පාර්ශ්වයෙන් ගත් කල, ඔහුගේ ප්‍රතිවාදියා බේගල් සහ අමන කතා දෙසා බාද්දී ඒවා අනුමත කරමින් හිස සලන අතර තුරුම, බුෂ් පරිපාලනයේ විදෙස් හා මිලිටරි පිලිවෙත් සම්බන්ධිතව ඔහුගේ විවේචන ඉදිරිපත් කරද්දී එල්ල කල සෑම ප්‍රහාරයක්ම ඉදිරියට ඇද ගෙන යාමට සැබැවින්ම ඔහු සමත් විය.

මාධ්‍යයන්ගේ අතිශයෝක්ති කතා සහ අපේක්ෂකයන්ගේ පුරාජේරු කතා මධ්‍යයේ ඉතා ප්‍රබලව මතුව පෙනුන කරුන වූයේ කෙරී සහ බුෂ් අතර පවත්නා වැදගත් වෙනස්කම්වල පරාසය අතිශය පටු බවයි. වංචනික කතා සහ එකිනෙකාට ඇනගැනීම්වලට පිටුපසින් අපේක්ෂකයින් දෙදෙනාම ආරක්ෂා කරන්නේ එක්සත් ජනපද මූල්‍ය කතිපයාධිපතිත්වයේ එකම මූලෝපායික අවශ්‍යතාවන් ය.

ඉරාක ආක්‍රමනයට හේතු දැක්වීමේදී ඇමරිකානු ජනතාව "නොමඟ යැවී" යැයි බුෂ්ව හෙලා දුටු කෙරී ඉරාකය තුල මැදිහත් වීම "තීන්දු ගැනීමේ දී කරන ලද දැවැන්ත වරද්දා ගැනීමක්" ලෙස හැඳින්විය. මහජනතාවට ව්‍යාකූල පනිවුඩ යැවීම සම්බන්ධයෙන් සහ ප්‍රධාන අන දෙන්නාගේ නිලය සඳහා සුදුසුකම් අහිමි කර ගත් වැනෙනසුලු භාවයක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් බුෂ් කෙරීව හෙලා දුටුවේ ය.

නමුත් භීතිය ගිනියම් කරමින් සහ රට අවදානම් තත්වයකට ඇද දමන්නේ යැයි තම ප්‍රතිවාදියාට චෝදනා කරමින් දෙදෙනාම තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කලහ. ඉරාක ආරක්ෂක හමුදාවන් වැඩේට පුහුනු කරන බව පවසමින් ජයග්‍රහනය තහවුරු වන තෙක් ඉරාකය තුල යුද්ධය ඉදිරියටම ගෙන යන බවට දෙදෙනාම ශපථ වූහ. "අභ්‍යන්තර ආරක්ෂාව" බලාත්මක කිරීම වේගවත් කරන බවට දෙදෙනාම තරයේ පොරොන්දු වූ අතර, විදෙස් පිලිවෙත්වල ඉහලම ප්‍රමුඛතාව හිමි වූයේ න්‍යෂ්ටික අවි විශාල ලෙස නිපදවීම නතර කිරීම සහ ත්‍රස්තවාදීන් සතුව ඇති න්‍යෂ්ටික අවි හරනය කිරීම යන කරුනුවලට එකඟ වූහ.

සෑම විටම මෙන් මෙහිදී ද කෙරීගේ අදහස් දේශපාලන දෙපිටකාට්ටුකමෙන් ව්‍යාකූල විය. වරද්දා ගැනීමක් සහ බොරු මත පදනම් වූ පිලිවෙතක් ලෙස සඳහන් කරමින් යුද්ධය හෙලා දුටු ඔහු, ඊලඟ හුස්මේ දී ඉරාකය තුල තව දුරටත් රැඳී සිටීම සහ යුද්ධයේ

ජයග්‍රහනය සම්බන්ධයෙන් ඔහුගේ කැපවීම තහවුරු කලේ ය. ඉරාකය සම්බන්ධයෙන් බුෂ් සමග ඔහුගේ නො එකඟතා මුලුමනින්ම උපායික ඒවා විය. ඔහුගේ මූලික තර්කය වූයේ මෙම අධිරාජ්‍යවාදී ව්‍යවසාය වත්මන් ජනාධිපතිවරනයට වඩා තරගකාරී සහ ඵලදායී ආකාරයෙන් ඉදිරියට ගෙන යාමට තමාට හැකි බවයි.

විවාදය මෙහෙයවන්නා ලෙස ක්‍රියා කල, මහජන ගුවන් විදුලි පද්ධතියේ ජිම් ලෙහ්රර් එක් අවස්ථාවක දී කෙරී විසින් දශක තුනකටත් පෙරාතුව සෙනෙට් සාකච්ඡා මන්ඩපයක් ඉදිරියේ වියට්නාම් යුද්ධය හෙලා දකිමින් කරන ලද කතාවකින් කොටසක් උපුටා දැක්වීය: "වරද්දා ගැනීමක් වෙනුවෙන් මිය යන අවසන් මිනිසා වන ලෙස යමෙකුගෙන් ඔබ ඉල්ලා සිටින්නේ කෙසේ ද?

වර්තමානයේ දී එක්සත් ජනපද සොල්දාදුවන් "ඉරාකය තුල මිය යමින් සිටින්නේ වරද්දා ගැනීමක් වෙනුවෙන් දැ" යි අසන ලද පැනයට කෙරී මෙසේ පිලිතුරු දුනි: "නෑ. මා විසින් දෙනු ලබන නායකත්වයෙන් සම්පාදනය කෙරෙන තතු යටතේ එය එසේ වන්නේ නෑ. මා විශ්වාස කරනවා මෙය ජයග්‍රහනය කල යුතු බැව්. ජනාධිපති සහ මම මේ කරුන සම්බන්ධයෙන් සෑම විටම එකඟ වී සිටියා."

ඩිමොක්‍රටික් අපේක්ෂකයා විසින් කරන ලද වඩාත් ඇඟ කිලිපොලා යන ප්‍රකාශන අතුරින් එකක් වූයේ, ඇති තරම් කෲරත්වයෙන් යුද්ධය ගෙන යාමට දැක්වූ අසමත් බව සම්බන්ධයෙන් බුෂ් පරිපාලනය හෙලා දකිමින් කල ප්‍රකාශයයි. "මට අවශ්‍යව ඇත්තේ භූමිය මත ගතිකයන්ගේ වෙනසක් ඇති කිරීමයි." ෆලූජා සහ අනෙකුත් ස්ථානවලින් ආපසු හැරී නො ඒමට සහ ත්‍රස්තවාදීනට වැරදි පනිවුඩ ලබා නො දීමට ආරම්භයේ සිටම මේ වෙනස්කම ඇති කල යුතු යි"

ෆලූජා වැනි ප්‍රධාන නගරවලට එරෙහිව මිලිටරි ප්‍රහාරයක් ඇරඹීම සඳහා එක්සත් ජනපද අනදෙන්නන් විවෘතවම සාකච්ඡා කරන තතු තුල කෙරීගේ මෙම ප්‍රකාශය සිදු වීමට යන ලේ වැගිරීමට දෙන ලද පූර්ව අනුමැතියකි.

කෙරී තවදුරටත් පෙන්වා දුන්නේ නොවැම්බර් මස මැතිවරනයෙන් ජය ගන්නේ කවරෙකු වුව ද ඉරාක යුද්ධය අවසන් ආක්‍රමනකාරී යුද්ධය නො විය යුතු බව යි. "පූර්වභංග යුද්ධය පිලිබඳ සමස්ත සංකල්පය" ගැන ඔහුගේ ආස්ථානය කුමක් ද යන පැනයට කෙරීගේ ප්‍රතිචාරය මෙසේ ය: "පූර්වභංග යුද්ධයක් සඳහා වන අයිතිය ජනාධිපතිවරයාට සෑම විටම තිබෙනවා. ඒ වගේම එම අයිතිය සැම විටම තිබූ දෙයක්. එය සීතල යුද්ධය පුරා පැවැති ශ්‍රේෂ්ඨ මතවාදයක්. ඇමරිකා එක්සත් ජනපදය කවර හෝ අයුරකින් ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය වූ විටෙක පූර්වභංගය සඳහා වූ අයිතිය මුලු මහත් ඇමරිකානු ඉතිහාසය පුරාවට කිසිම ජනාධිපතිවරයකු විසින් පාවා නො දුන්නා සේ ම මම ද එය පාවා දෙන්නේ නෑ."

මෙය ඉතිහාසය මුසාකරනය කිරීමකි. සීතල යුද සමය තුල සෑම පරිපාලනයක්ම ක්‍රියාවට දැමුවේ සෝවියට් සංගමයට එරෙහි "රඳවා තැබීමේ" පිලිවෙතයි. අද දින බුෂ් පරිපාලනය තුල ප්‍රධාන නිලයක් හොබවන බොහොමයක් දෙනා හඳුනා ගනු ලැබුවේ රීගන් යටතේ "ආපසු තල්ලු කිරීම" නම් වූ පිලිවෙත මගින් ඉහත මූලෝපාය විස්ථාපනය කිරීමට ගන්නා ලද එලැඹුමක් සමග ය. අවි තරගය ඉහල නැංවීම, සෝවියට් සංගමය සමග මුන ගැටුම, සහ ආක්‍රමනශීලී න්‍යෂ්ටික යුද්ධයක් සඳහා අවශ්‍ය අවි පද්ධති වර්ධනය කිරීමේ උත්සාහය මත මෙම පිලිවෙත පදනම් විය.

කෙසේ නමුත්, බුෂ් පරිපාලනය විසින් වර්ධනය කරන ලද මෙම "පූර්වභංග යුද්ධ" මතවාදය ගුනාත්මකව නව ප්‍රපංචයකි. 2002 වසරේ නිකුත් වූ "ජාතික ආරක්ෂක මූලෝපාය" නම් වූ ලේඛනයෙන් කියැවෙන පරිදි, එක්සත් ජනපදය අවශ්‍යතාවන්ට තර්ජනයක් වී ඇතැයි ඔවුන් විශ්වාස කරන - හෝ අනාගතයේ දී එසේ විය හැකි - කවර හෝ ජාතියකට එරෙහිව අප්‍රකුපිත යුද්ධයක් දියත් කිරීම සඳහා වොෂින්ටනයට ඇති "අයිතිය" මෙම නව පිලිවෙත මගින් ප්‍රවර්ධනය කෙරේ. ඇඩි රාජ්‍ය තාන්ත්‍රික පදවලින් පවසතොත් මෙය පූර්වභංග යුද පිලිවෙතක් නො වේ. ඒ වෙනුවට මෙය ජාත්‍යන්තර නීතියට අනුව යුද අපරාධයක් වන නිවාරක යුද්ධයකි.

න්‍යෂ්ටික යුද්ධයක ශක්‍යතාව පවා අන්තර්ගත, වඩාත් අන්තරායකාරී මිලිටරි ක්‍රියාවන් කරා අනිවාර්යයෙන් ගමන් කෙරෙන, ඉරාකයට එරෙහිව බුෂ් විසින් ක්‍රියාවට දමන ලද ක්‍රමවේදයන් ම අනුගමනය කිරීමට තමා සූදානම් බව කෙරී පෙන්නුම් කලේ ය. "ඉරානය හා උතුරු කොරියාව දැන් වඩාත් අන්තරායකාරී යැ" යි ඔහු පැවැසී ය. "පූර්වභංගය අවසානයේ දී සිදු විය හැකි දේ වෙන්න පුලුවන්. මං ඒක තවම දන්නෙ නෑ. නමුත් මම මෙය කිව යුතු යි. ජනාධිපති හැටියට මම මගේ දැස් කිසි විටෙකත් ඒ පන්දුවෙන් ඉවතට යොමු කරන්නෙ නෑ."

තම අදහස් දැක්වීම අවසන් කරමින් කෙරී නැවත නැවතත් කියා සිටියේ ඉරාකය තුල යුද්ධය සහ එහි රැඳී සිටීම තව දුරටත් ඉදිරියට ගෙන යන බවට කැප වන බව යි. "මට ඉරාකය සම්බන්ධයෙන් සැලැස්මක් තිබෙනවා" යනුවෙන් ඔහු පැවසී ය. "මං විශ්වාස කරනවා අපට සාර්ථක වෙන්න පුලුවන් කියල. මං කතා කරන්නෙ අතහැර දැමීම ගැන නො වෙයි. ජයග්‍රහනය ගැන."

ත්‍රස්තවාදයට එරෙහි සඳ් ව්‍යාපාරයේ නාමයෙන් කරන ලද කවර යුද අපරාධයක් සම්බන්ධයෙන් හෝ අබු ග්‍රයිබ් බන්ධනාගාරයේ ඉරාක රැඳවියන්ට කරන ලද වධ හිංසා සම්බන්ධයෙන් හෝ සාකච්ඡාව මෙහෙය වූ තැනැත්තා සහ අපේක්ෂකයින් දෙදෙනා කිසිම සඳහනක් නො කිරීම කැපී පෙනුන කරුනකි.

බුෂ් සම්බන්ධයෙන් කරන ලද විවේචන කුමක් වුවත්, කෙරීගේ නිරූපනයෙන් ඉතා පැහැදිලිව පෙනී ගිය දෙය නම්, ඉරාකය තුල ගෙන යන යුද්ධය සාපරාධී ක්‍රියාවක් ලෙස නිරවද්‍යව දකින හා විනාශ කරන ලද

රටෙන් එක්සත් ජනපද හමුදාවන් පිට වී යා යුතු යැයි අපේක්ෂා කරන මිලියන සංඛ්‍යාත ඇමරිකානුවන්ගේ හැඟීම්වලට ආයාචනා කිරීම මගින් මැතිවරනය ජයග්‍රහනය කිරීමේ අදහසක් ඔහුට නොමැති බවයි.

පලමු ජනාධිපතිත්ව විවාදයෙන් මතු කර පෙන්වනු ලැබුවේ එක්සත් ජනපද ද්වි-පක්ෂ ක්‍රමයේ පටු සහ දක්ෂිනාංශික පරාමිතිකයන් ය. සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂකයන් ඇතුලු ස්වාධීන සහ තෙවැනි - පක්ෂ අපේක්ෂකයන් ඉවත් කර තබා ඇති අතර හරිත පක්ෂයේ අපේක්ෂකයා ලෙස 2000 ජනාධිපතිවරනයේ දී ඡන්ද 2,800,000කටත් වඩා ලබා ගත් රැල්ෆ් නාඩර්ට පනවා ඇති වාරනය දීර්ඝ කෙරී ඇත.

මහා ව්‍යාපාරිකයෝ පක්ෂ ද්වය විසින් ඒකාධිකාරීකෘත දේශපාලන සංස්ථාපිතය තුල, ඇමරිකානු මහජනතාවගෙන් බහුතරයක අවශ්‍යතා සහ උත්සුකයන්වලට ප්‍රකාශනයක් සොයා ගත නො හේ.

වහාම සහ කොන්දේසි විරහිතව ඉරාකයෙන් සියලු එක්සත් ජනපදස හමුදා ඉවත් කරන ලෙස ඉල්ලමින්, සංගත-පාලිත පක්ෂ දෙකට සැබෑ විකල්පයක් ඉදිරිපත් කිරීම සඳහා සමාජවාදී සමානතා පක්ෂය ඉදිරියට යනු ඇත. අපගේ උද්ඝෝෂනය යොමුව පවත්නේ, නොවැම්බර් මැතිවරනයේ දී ඩිමොක්‍රැටික්වරුන්ගෙන් හෝ රිපබ්ලිකන්වරුන්ගෙන් කවරකු ජයග්‍රහනය කල ද, ඉදිරි අරගලයන්හි ආවශ්‍යක කෙරෙන කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් සූදානම් කිරීම වෙත ය.

© www.wsws.org